සැ. යු. - 2020.01.17 වැනි දින පළ වූ අංක 2,159 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,160 - 2020 ජනවාරි මස 24 වැනි සිකුරාදා - 2020.01.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 12 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 15 |


සැ. යු. -(i) ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත 2020 ජනවාරි මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ජාතිය ගොඩ නැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2020 ජනවාරි මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත 2020 ජනවාරි මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 පෙබරවාරි මස 14 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 ජනවාරි මස 31 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

11 - B 82001 - 353 (2020/01)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

බස්නාහිර පළාත් සභාවේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, ජී. එස්. අයි. විමලසේන වන මම ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ලංකාණ්ඩුව විසින් 1990.03.29 වැනි දින ප්‍රදානය කර ඇති අංක ගම්/ප්‍ර/10906 දරන දීමනා පත්‍රයේ හිමිකරු වන අංක 305/91, ඌරුවල, බුත්පිටිය ලිපිනයේ පදිංචි කරන්නාගොඩ කංකානම්ලාගේ ගුණසේකර වෙත ප්‍රදානය කොට ගම්පහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක - යටතේ දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකුවීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2020.02.21 දිනට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතුය.

### උපලේඛනය

ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සියනෑ කෝරළයේ 302 ඒ ඌරුවල නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඌරුවල නැමති ගමේ පිහිටා ඇත්තාවූ ගම්පහ දිස්ත්‍රික් මැනුම් අධිකාරි භාරයේ ඇති සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක මු. පි. ගම්. 1006 දරන පිඹුරේ 42 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්. 0.089 ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | - | කැබලි අංක 41, |
| *නැගෙනහිරට* | - | ප්‍රවේශ මාර්ගය, |
| *දකුණට* | - | තලගහවත්ත, |
| *බස්නාහිරට* | - | ගලහිටිකුඹුර. |

ජී. එස්. අයි. විමලසේන,
ප්‍රාදේශීය ලේකම්,
මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
රම්මුතුගල - කඩවත.

2019 සැප්තැම්බර් මස 06 වැනි දින.

01-550/3

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

බස්නාහිර පළාත් සභාවේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, පී. ඩී. ටී. සී. රාජිකා වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1984 අප්‍රේල් මස 06 දින ප්‍රදානය කර ඇති අංක ගම්/ප්‍ර/4376 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන 27/21 පරාක්‍රම පාර, මත්තුමගල, රාගම පදිංචි ව සිටි පවුත්තුවාදූර බියට්‍රිස් මදුරාවතී වෙත ප්‍රදානය කොට ගම්පහ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 189 පත්ඉරුව යටතේ 1984.10.18 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2020.02.21 දිනට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතුය.

### උපලේඛනය

ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රාගම් පත්තුවේ/කෝරළේ 177 මත්තුමගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මත්තුමගල ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක එල් 6/31 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක මු. පි. ගම් 423 දරන කට්ටි කැඩීමේ පිඹුරේ .... විසින් සම්පාදිත අංක ...... දරන රේඛා සටහනේ අංක 10 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.034 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | - | කට්ටි අංක 09, |
| *නැගෙනහිරට* | - | මු. පි. ඒ. 3632/1, |
| *දකුණට* | - | කට්ටි අංක 16, |
| *බස්නාහිරට* | - | කට්ටි අංක 11. |

පී. ඩී. ටී. සී. රාජිකා,
ප්‍රාදේශීය ලේකම්,
වත්තල.

2019 අගෝස්තු මස 29 වැනි දින.

01-550/2

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

බස්නාහිර පළාත් සභාවේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, ජී. එස්. අයි. විමලසේන වන මම ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ලංකාණ්ඩුව විසින් 1984.10.11 වැනි දින ප්‍රදානය කර ඇති අංක ගම්/ප්‍ර/1942 දරන දීමනා පත්‍රයේ හිමිකරු වන අංක 79/10, බංගලාවත්ත, රම්මුතුගල, කඩවත ලිපිනයේ පදිංචි හබරගම කෝරාලලාගේ කරලැයින් නෝනා වෙත ප්‍රදානය කොට ගම්පහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 05/44 යටතේ 1986.09.26 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇත. එබැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2020.02.21 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

### උපලේඛනය

ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සියනෑ කෝරළයේ 287 බී කිරිල්ලවල දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කිරිල්ලවල නැමති ගමේ පිහිටා ඇත්තාවූ ගම්පහ දිස්ත්‍රික් මැනුම් අධිකාරී භාරයේ ඇති සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක මු. පි. ගම්. 401 දරන පිඹුරේ 10 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්. 0.081 ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | - | කට්ටි අංක 1, |
| *නැගෙනහිරට* | - | ප්‍රවේශ මාර්ගය, |
| *දකුණට* | - | කට්ටි අංක 11, |
| *බස්නාහිරට* | - | හිපි 202617. |

ජී. එස්. අයි. විමලසේන,
ප්‍රාදේශීය ලේකම්,
මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
රම්මුතුගල - කඩවත.

2019 ඔක්තෝබර් මස 21 වැනි දින.

01-550/1

## ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩ පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ආර්. ඒ. ඩී. ටී. එන්. තෙන්නකෝන් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් එක්දහස් නවසිය අසූ අටේ ඔක්තෝබර් මස විසි වැනි දින ප්‍රදානය කර ඇති අංක මහ/ප්‍ර/10262 ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන රණවල ජනපදයේ පදිංචි කිරයාදුරයෙලා ගෙදර සිරිදරු වෙත ප්‍රදානය කොට ගම්පොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. සී 5/04 යටතේ 1989.02.07 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2020.02.14 දිනට පෙර මා වෙත දැනුම් දිය යුතුය.

### උපලේඛනය

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගඟ පහල පත්තුව/ කෝරළේ, බෝවල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බෝවල හා උනම්බුව නැමති ගමේ පිහිටා ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක මු.පි. මහා 2480 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි රේඛා අංක 59 (පනස් නවය) දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.151 රූඩ් නැත, පර්චස් නැත, විශාලත්වය ඇත්තා වූද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම: රණවල ජනපදය

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 58, ප්‍රවේශ මාර්ගය, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 76, ප්‍රවේශ මාර්ගය, |
| දකුණට | : | ඇල රක්ෂිතය, |
| බස්නාහිරට | : | ඇල රක්ෂිතය. |

ආර්. ඒ. ඩී. ටී. එන්. තෙන්නකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
උඩපළාත, ගම්පොල.

01-551

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය**

මධ්‍යම පළාත් සභාවේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් මාදූවගේ යුරේෂ් නිශාන්ත වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1987.08.18 වැනි දින ප්‍රදානය කර ඇති අංක මාතලේ/ප්‍ර/7843 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ගලේවෙල, බඹරගස්වැව, මානාහිඳ පදිංචි පටබැඳි ගෙදර දේවසිංහ වෙත ප්‍රදානය කොට ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2020.02.03 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දපල්ල කෝරලේ බඹරගස්වැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මානාහිඳ නැමති ගමේ පිහිටා ඇත්තා වූ ද, දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරී භාරයේ ඇති අංක ග.සි. 334 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 284 හා 294 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර 01, රූඩ් 01, පර්චස් 36ක් විශාලත්වය ඇත්තා වූද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම, හැකිරිල්ලේ යාය ජනපදය,

*උතුරට* : කැබලි අංක 282 හා 285,
*නැගෙනහිරට* : කැබලි අංක 286,
*දකුණට* : කැබලි අංක 289 (පාර),
*බස්නාහිරට* : කැබලි අංක 283 හා 293.

මාදූවගේ යුරේෂ් නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
ගලේවෙල.

2019 අගෝස්තු මස 07 වැනි දින.

01-549/2

මගේ අංකය : 8/3/6/අලු/55
2019.11.12 දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
මාතලේ.

**ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය**

මධ්‍යම පළාත් සභාවේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් කළහේ පාඩි කෝරාළගේ ලංකා ප්‍රියානී මධුවන්තී වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.11.07 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/මාලේ/346 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 08, අළුවිහාරේ II ජනපදය, මාතලේ පදිංචි ගාර්දියේ පුංචිහේවාගේ අනුලාවතී ද සිල්වා මහත්මිය වෙත ප්‍රදානය කොට මාතලේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක මධ්‍යම/මාලේ/346/2367/95 යටතේ 1995.11.16 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2020.02.03 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

**උපලේඛනය**

මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගම්පහසිය පත්තුවේ, බීරිදෙවල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, අළුවිහාරේ නැමති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත, මිනින්දෝරු අධිකාරී, මාතලේ භාරයේ ඇති අංක 1 15/44,45 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක මු. පි. මා. 155 දරන පිඹුරේ අංක 08 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූද, ප්‍රමාණයෙන් පර්චස් 19.2 විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම - අළුවිහාරේ II ජනපදය.

*උතුරට* : මු.පි.මා. 155 - අංක 07 ඇල රක්ෂිතය,
*නැගෙනහිරට* : මු.පි.මා. 155 - අංක 07 ඇල රක්ෂිතය,
*දකුණට* : මු.පි.මා. 155 - අංක 07 ඇල රක්ෂිතය,
*බස්නාහිරට* : මු.පි.මා. 155 - කැබලි අංක 09.

කේ. පී. කේ. එල්. පී. මධුවන්ති,
ප්‍රාදේශීය ලේකම්,
මාතලේ.

2019 නොවැම්බර් මස 12 වැනි දින.

01-549/1

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/40668.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :-
පළාත්/ඉකො/ඉ4/කොබෙ/2-48.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 1314 තෙලහැර ග්‍රාම නිලධාරී වසමේ තෙලහැර ගමේ පිහිටි කච්චේරි මිනින්දෝරු විසින් අඳින ලද 2012/22 දල අනුරේඛනයේ කැබලි අංක A ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 14ක් විශාල වූ ඉඩම් කොටස සමිති කටයුතු සඳහා සීමා රහිත තෙලහැර සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමූපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

*උතුරට* : කැබලි අංක 40 හා ප්‍රාදේශීය සභා මාර්ගය;
*නැගෙනහිරට* : කැබලි අංක 56 ;
*දකුණට* : කැබලි අංක 56, 40 ;
*බටහිරට* : කැබලි අංක 40.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2019.10.18 දින සිට ඉදිරියට);

(ආ) *වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ගරු ඇමතිතුමා අනුමත කළ 2019 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%කි ;

වාර මුදල. - නැත.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

(ඉ) සාදා ඇති ගොඩනැගිලි/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

(ඊ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය;

(උ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(ඌ) 2019.10.18 දින සිට වසර 05 ක් ගතවනතුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ;

(එ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් නිවේදනය* පළ කරන දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ඩබ්ලිව්. කේ. එන්. නයෝමි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2020 ජනවාරි මස 24 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

01-541

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/53443.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :-
පළාත්/ඉකො/ඉ9/වාරි/දී. බ. 03.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 1255 තඹරව ග්‍රාම නිලධාරී වසමේ තඹරව ගමේ පිහිටි ජනපද නිලධාරී විසින් අඳින ලද අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 9.25ක් විශාල වූ ඉඩම් කොටස සමිති කටයුතු සඳහා සීමාරහිත තඹරව සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමූපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

*උතුරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*දකුණට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*බටහිරට* : නයනානන්දට අයිති ඉඩම (අ. ග. පි. 2500 කැබලි අංක 410).

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ) බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2019.10.18 දින සිට ඉදිරියට);

*(ආ) වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ගරු ඇමතිතුමා අනුමත කළ 2019 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%කි ;

වාර මුදල. - නැත.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(ඊ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය;

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(ඌ)* 2019.10.18 දින සිට වසර 05 ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ;

*(එ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් නිවේදනය* පළ කරන දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ඩබ්ලිව්. කේ. එන්. නයෝමි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2020 ජනවාරි මස 24 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

01-542

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/57340
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :-
පළාත්/ඉකො/ඉ9/කොට/දීබ./01.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 240 හුලව ග්‍රාම නිලධාරි වසමේ යද්දිගෙදර ගමේ ගොඩපොකුණයාය ඉඩමේ පිහිටි අ.ග.පි. 3157 හි කැබලි අංක 01 කොටසක් ලෙස නැවත මැන සකසන ලද 2012/495 දළ අනුරේඛනයේ කැබලි අංක A ලෙස දක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.1591 විශාල වූ රජයේ ඉඩම් කොටස ආගමික කටයුත්ත සඳහා ශ්‍රී කල්‍යාණ මිත්‍ර තපෝ ආරාමයේ භාරකාර මණ්ඩලය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

*උතුරට* : අ. ග. පි. 3157 හි කැබලි අංක 33 සහ 31;
*නැගෙනහිරට* : අ. ග. පි. 3157 හි කැබලි අංක 31 සහ මෙම පිඹුරේ කැබලි අංක B,C සහ D ;
*දකුණට* : මෙම පිඹුරේ කැබලි අංක C, D සහ මෙම පිඹුරේ අංක B, C සහ D ;
*බටහිරට* : අ. ග. පි. 3157 හි කැබලි අංක 33.

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ) බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2019.10.18 දින සිට ඉදිරියට);

(*ආ*) *වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ගරු ඇමතිතුමා අනුමත කළ 2019 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%කි ;

වාර මුදල. - නැත.

(*ඇ*) බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය;

(*ඉ*) සාදා ඇති ගොඩනැගිලි/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

(*ඊ*) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය;

(*උ*) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(*ඌ*) 2019.10.18 දින සිට වසර 05 ක් ගතවනතුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ;

(*එ*) බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් නිවේදනය* පළ කරන දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ඩබ්ලිව්. කේ. එන්. නයෝමි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2020 ජනවාරි මස 24 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

01-543

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/57356
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :-
පළාත්/ඉකො/ඉ9/නික/දී.බ.06.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 320, ඇලවක ග්‍රාම නිලධාරි වසමේ හැළඹැව ගමේ පිහිටි අ. ග. පි. 2968 පිඹුරෙහි කැබලි අංක 236න් කොටසක් සඳහා රජයේ මිනින්දෝරු විසින් අඳින ලද 05/නික/2016 දල අනුරේඛනයේ කැබලි අංක A ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 7ක් විශාල වූ ඉඩම් කොටස සමිති කටයුතු සඳහා සීමාසහිත ඇලවක මහසෙන් සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

*උතුරට* : මාර්ග රක්ෂිතය ;
*නැගෙනහිරට* : සුජාතා හිමිකම් කියන ඉඩම ;
*දකුණට* : අ. ග. පි. 36 කොටසක් ;
*බටහිරට* : අ. ග. පි. 36 කොටසක්.

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(*අ*) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2019.10.18 දින සිට ඉදිරියට);

(*ආ*) *වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ගරු ඇමතිතුමා අනුමත කළ 2019 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%කි ;

වාර මුදල. - නැත.

(*ඇ*) බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය;

(*ඉ*) සාදා ඇති ගොඩනැගිලි/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

(*ඊ*) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය;

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(ඌ)* 2019.10.18 දින සිට වසර 05 ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ;

*(එ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් නිවේදනය* පළ කරන දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ඩබ්ලිව්. කේ. එන්. නයෝමි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2020 ජනවාරි මස 24 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

01-544

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/57614.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :-
පළාත්/ඉකො/ඉ9/වාරි/දි. බ. 05.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 1239, විලාකටුපොත ග්‍රාම නිලධාරි වසමේ පාදුගම ගමේ පිහිටි අ. ග. පි. 2521 සැලැස්මේ කැබලි අංක 45න් කොටසක් සඳහා කච්චේරි මිනින්දෝරු විසින් අඳින ලද 02/වාරි/2018 දල අනුරේඛනයෙහි කැබලි අංක A දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.05058 විශාල වූ රජයේ ඉඩම් කොටස සමිති කටයුතු සඳහා විලාකටුපොත එක්සත් අවමංගල්‍යාධාර සමිතියේ භාරකාර මණ්ඩලය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

*උතුරට* : අ. ග. පි. 2521 හි කැබලි අංක 44 ;
*නැගෙනහිරට* : අ. ග. පි. 2521 හි කැබලි අංක 45 ;
*දකුණට* : මාර්ගය ;
*බටහිරට* : අ. ග. පි. 2521 හි කැබලි අංක 27 සහ 28.

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ) බදු කාලය* .- අවුරුදු පහයි. (05) (2019.10.28 දින සිට ඉදිරියට);

*(ආ) වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ගරු ඇමතිතුමා අනුමත කළ 2019 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%කි ;

වාර මුදල. - නැත.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය;

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(ඊ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය;

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(ඌ)* 2019.10.28 දින සිට වසර 05 ක් ගතවනතුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ;

*(එ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් නිවේදනය* පළ කරන දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ඩබ්ලිව්. කේ. එන්. නයෝමි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2020 ජනවාරි මස 24 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

01-545

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/57339.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :-
පළාත්/ඉකො/ඉ9/මහව/දී. බ. 06.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 199 බලල්ල ග්‍රාම නිලධාරි වසමේ බලල්ල ගමේ පිහිටි අ. ග. පි. 2361 හි කැබලි අංක 149න් කොටසක් සඳහා ජනපද නිලධාරි විසින් අඳින ලද දළ අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් පර්. 26.7132 ක් විශාල වූ රජයේ ඉඩම් කොටස සමිති කටයුතු සඳහා බලල්ල අන්‍යෝන්‍යාධාර සුභසාධක සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

*උතුරට* : පී. එච්. උක්කු අම්මාගේ ඉඩම හා ප්‍රවේශ මාර්ගය ;
*නැගෙනහිරට* : ප්‍රවේශ මාර්ගය සහ එල්. ජේ. එම්. කපුරු බණ්ඩාගේ ඉඩම ;
*දකුණට* : එල්. ජේ. එම්. කපුරුබණ්ඩාගේ ඉඩම හා පී. එච්. උක්කු අම්මාගේ ඉඩම ;
*බටහිරට* : පී. එච්. උක්කු බණ්ඩාගේ ඉඩම.

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ) බදු කාලය* .- අවුරුදු පහයි. (05) (2019.10.28 දින සිට ඉදිරියට);

*(ආ) වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ගරු ඇමතිතුමා අනුමත කළ 2019 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2%කි ;

වාර මුදල. - නැත.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති ශාලාව ඉදි කිරීම සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය;

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(ඊ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය;

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් නිවේදනය* පළ කරන දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ඩබ්ලිව්. කේ. එන්. නයෝමි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2020 ජනවාරි මස 24 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

01-546

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/59830.
ඉඩම් කොමසාරිස්ගේ අංකය :-SPLC/GAL/4/11/3/30.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ගාල්ල දිස්ත්‍රික්කයේ, නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට, අයත් 232 ඩී, මැදගම ග්‍රාම නිලධාරි වසමේ මැදගම ගමේ GA/NL/W/2017/1158 අනුරේඛනයේ කැබලි අංක A ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0094 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වාණිජ කටයුතු සඳහා ලංකා බෙල් ලිමිටඩ් විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

*උතුරට* : කැබලි අංක 68 ;
*නැගෙනහිරට* : කැබලි අංක 68 ;
*දකුණට* : කැබලි අංක 68 ;
*බටහිරට* : කැබලි අංක 66 හා 68.

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2019.11.15 වැනි දින සිට ඉදිරියට);

*වාර්ෂික බදු මුදල* .- බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතුය.

(ආ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

(ඇ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

(ඈ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

(ඉ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය;

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(උ) 2019.11.15 වැනි දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බද දීම් කළ නොහැක;

(ඌ) බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළ- හොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ටී. යූ. කේ. සටන්නායක,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2020 ජනවාරි මස 24 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, "මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

01-547

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/19213.
ඉඩම් කොමසාරිස්ගේ අංකය :- SPLC/GAL/3/3/84.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ගාල්ල දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 94 එච්, රුකඩහේන ග්‍රාම නිලධාරි වසමේ රුකඩහේන ගමේ පිහිටි අ. ග. පි. 602 දරන පිඹුරේ කැබලි අංක 228 1/2 මගින් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.289 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ල කෘෂිකාර්මික කටයුත්තක් සඳහා සෝමපාල බණ්ඩාරිගොඩගේ මහතා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් :

*උතුරට* : කැබලි අංක 226 ;
*නැගෙනහිරට* : කැබලි අංක 225 ;
*දකුණට* : කැබලි අංක 228 2/2 ;
*බටහිරට* : කැබලි අංක 227.

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) පළමු *බදු කාලය* .- අවුරුදු විසිතුනයි (23) (1995.06.15 දින සිට 2018.06.14 දින දක්වා);

(ආ) *වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක් ම සංශෝධනය වය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ බදු මුදලින් 50%කට නොවැඩි විය යුතු ය.

*දඩ මුදල.* - 1995 වර්ෂයේ ඉඩමේ දියුණු වටිනාකමින් 12% කි.

දෙවන බදු කාලය .- අවුරුදු තිහයි (30) (2018.06.15 දින සිට 2048.06.14 දින දක්වා)

*වාර්ෂික බදු මුදල* .- සියළු ප්‍රතිශෝධන සහිතව මුල් වසර විසිතුන අවසානයේ අයකළ බදු මුදලින් 20% ක ප්‍රමාණයක් එකතුකොට ලබා ගන්නා අගය වේ. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතු ය.

*දඩ මුදල.* - දඩ මුදලක් අය නොකෙරේ.

(ඇ) මෙම ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය;

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(උ)* 2019.10.28 වැනි දින සිට වසර 05ක් ගතවන තුරු ඉඩම අතුරු බදුදීම් සඳහා අවසර දෙනු නොලැබේ. ඉන්පසු වුව ද අතුරු බදු හෝ පැවරීම් කළ හැක්කේ මෙම ඉඩම බ දුගත් කාරණය සඳහ පමණි.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළ-හොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ටී. යූ. කේ. සටන්නායක,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2020 ජනවාරි මස 24 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, "මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

01-548

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.